සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 08 | විෂයය / பாடம் / Subject: නාට්‍ය හා රංගකලාව | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 1 1/2 |

නම :- ........................................................ විභාග අංකය :- ..........................

සැලකිය යුතුයි:

* ප්‍රශ්න පත්‍ර I හා II යන කොටස්වලින් සමන්විතයි. I කොටසේ සියලුම ප්‍රශ්නවලටද II කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 03කට පමණක් පිළිතුරු සපයන්න. ප්‍රායෝගික ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 50කි. අවසාන ලකුණු ගණනය කිරීමේ දී ලිඛිත හා ප්‍රායෝගික ප්‍රශ්න පත්‍රවල ලකුණු එකතුව 100% ට ගණනය කර ලකුණු ලබා දෙන්න.

## I කොටස

❖ අංක 01 - 05 දක්වා ප්‍රශ්නවලට අදාළ නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

(01) සමස්ත ශරීරාංග චලනය කිරීමෙන් අදහස් ප්‍රකාශ කිරීම

(1) වාචික අභිනය නමින් හැඳින්වේ. (2) සාත්වික අභිනය නමින් හැඳින්වේ.

(3) ආංගික අභිනය නමින් හැඳින්වේ. (4) ආහාර්ය අභිනය නමින් හැඳින්වේ.

(02) නාට්‍යයක චරිතයේ බාහිර ලක්ෂණ නිරූපණය කිරීම සඳහා නළුවාගේ ගැලපීම අවශ්‍ය වේ. මෙසේ නළු නිළියන් තෝරා ගැනීම

(1) අභිරූපණය යනුවෙන් හැඳින්වේ.

(2) අනුකරණය යනුවෙන් හැඳින්වේ.

(3) බාහිර සමාරෝපය නමින් හැඳින්වේ.

(4) නළුවරණය නමින් හැඳින්වේ.

(03) පෙනෙන හෝ දකින හෝ අසන දෙයට වඩා අළුතින් යමක් සිතීම හඳුන්වනු ලබන්නේ,

(1) කල්පිතය යනුවෙනි. (2) සංකල්පය යනුවෙනි.

(3) නිර්මාණ යනුවෙනි. (4) පරිකල්පනය යනුවෙනි.

(04) නාට්‍යෝචිත අවස්ථාවක් යනුවෙන් හඳුන්වන්නේ මින් කුමක් ද?

(1) නාට්‍යමය ජවනිකාවකි. (2) නාට්‍යයේ යම් සිදුවීමකි.

(3) නාට්‍යයට උචිත අවස්ථාවකි. (4) නාට්‍යයේ ගැටුම්කාරී අවස්ථාවකි.

(05) කතා වස්තුවක අවස්ථා හා සිද්ධි තුළ ඇති ක්‍රියා ප්‍රේක්ෂකයන් හමුවට පමුණුවන්නේ,

(1) සංවාද මගිනි. (2) රූපණය මගිනි.

(3) චරිත මගිනි. (4) චරිත නිරූපණය මගිනි.

❖ **ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා පහත සඳහන් වචන සුදුසු පරිදි යොදා ගනිමින් හිස්තැන් පුරවන්න..**

(නාට්‍යෝචිත, මුලමැද අග, රංගවිධාන, තේමාව, ගැටුම)

නාට්‍ය පෙළක් කියවීමේ දී එහි (06) ................................................ ඉස්මතු විය යුතු ය. එමෙන් ම නාට්‍ය පෙළෙහි (07) ................................................ ප්‍රබල අංගයක් වේ. කතාවේ සිදුවන ඇතැම් ක්‍රියාවන් හා චරිතයන්හි සුවිශේෂී හැසිරීම් (08) ................................................ ලෙසට ඇතුළත් කළ හැකි ය. කතාවක (09) ................................................ ගැළපීම් ඇතත්, නාට්‍යයක් ගොඩ නැගීමට අවශ්‍ය වන්නේ (10) ........................................... අවස්ථා පමණි.

❖ **කෙටි පිළිතුරු සපයන්න.**

(11) නළුවකු රංගනයට ගැළපෙන ආකාරයට කටහඬ සකස් කර ගැනීම සඳහා කියවීමට සුදුසු ග්‍රන්ථයක් නම් කරන්න. ..............................................................................................

(12) සංවාද භාවිතා නොකර කිසියම් සිද්ධියක් හෝ අවස්ථාවක් නිරූපණය කිරීම හඳුන්වන්නේ කුමන නමකින් ද? ..............................................................................................

(13) ජාතක කථාවක් ඇසුරින් නිර්මාණය වූ නාට්‍යයක් සඳහන් කරන්න.

..............................................................................................

(14) නරිබෑණා නාට්‍යයේ නිෂ්පාදකයා කවුරුන් ද?

..............................................................................................

(15) කතාන්දරයක් හා නාට්‍යයක් අතර ඇති එක් වෙනස්කමක් ලියන්න.

..............................................................................................

(16) සංගීතයෙන් නාට්‍යයට ලැබෙන එක් ප්‍රයෝජනයක් ලියන්න.

..............................................................................................

(17) අංග රචනය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

..............................................................................................

(18) ආගමික කතා ඇසුරින් නාට්‍ය බිහිවීම නිසා සමාජයේ ඇතිවූ වෙනස්කමක් ලියන්න.

..............................................................................................

(19) නාට්‍ය දර්ශනයක් සඳහා මුදල් යොදවන්නා කුමන නමකින් හඳුන්වයි ද?

..............................................................................................

(20) "සෝබාව දේ මෙපුර" මෙම ගීතය කුමන නාට්‍යයකට අයත් වේද?

..............................................................................................

ලකුණු 1 x 20 = 20

## II කොටස

*** පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 03කට පිළිතුරු සපයන්න.**

(01) (i) සිරිත් මල්දම රචනා කරනු ලැබුවේ කවුරුන් විසින් ද? (ලකුණු 01)

(ii) යමෙකු අකාලයේ මරණයට පත්වන අයහපත් ක්‍රියාවන් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(iii) සිරිත් මල්දමෙහි කියැවෙන මත්පැන් බීමෙන් ඇතිවන ආදීනව දෙකක් ලියන්න. (ලකුණු 02)

(iv) සිරිත් මල්දමෙහි දැක්වෙන පරිදි වැඩක නොයෙදෙන හිතට කුමක් සිදුවෙයි ද? (ලකුණු 01)

(v) මෙහි දක්වා ඇති දුම්බීමෙහි ආදීනව දෙකක් දක්වන්න. (ලකුණු 02)

(vi) සිරිත් මල්දමෙහි ආහාර අනුභවය පිළිබඳව ලබාදී ඇති උපදේශය කුමක් ද? (ලකුණු 02)

(02) (i) ශරීරය සැහැල්ලු කර ගැනීමට පුහුණු කළයුතු රංග අභ්‍යාසය කුමක් ද? (ලකුණු 02)

(ii) ශරීරය සැහැල්ලුවෙන් තබා ගැනීම රංගනයට වැදගත් වන්නේ කෙසේදැයි කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03)

(iii) නළුවකු රංග අභ්‍යාසවල නිරතවීමේ දී ලබාගන්නා ප්‍රයෝජන පහක් ලියන්න. (ලකුණු 05)

(03) (i) වේෂ භූෂණය නමින් හඳුන්වන්නේ කුමක් ද? (ලකුණු 02)

(ii) නාට්‍යයක වේෂ භූෂණ නිර්මාණය කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) රජ කෙනෙකුගේ චරිතය නිරූපණය කිරීමට සුදුසු රංග වස්ත්‍රවල රූප සටහනක් අඳින්න. (ලකුණු 05)

(04) (i) මාෂා හා වළහා නාට්‍යයේ නිෂ්පාදකයා කවු ද? (ලකුණු 02)

(ii) මාෂා හා වළහා නාට්‍යයේ එන චරිත තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) මාෂා හා වළහා නාට්‍යයේ එන කතා පුවත කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(05) (i) නාට්‍ය කලාවේ දී කටහඬ අභ්‍යාසයක් වශයෙන් ජන ගී ගායනය කළ හැකි ය. එවැනි ජන ගී වර්ගයක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ශාන්ති කර්ම ගීත අයත්වන නර්තන සම්ප්‍රදායන් තුනෙහි නම් ලියන්න. (ලකුණු 03)

(iii) ඔබ ඉගෙන ගත් ශාන්ති කර්ම ගීතයක් ලියන්න. (ලකුණු 05)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 08 | විෂයය / பாடம் / Subject: නාට්‍ය හා රංගකලාව | පත්‍රය / வினாத்தாள் / Paper: ප්‍රායෝගික පරීක්ෂණය |

(01) පෙළ ආශ්‍රිත භාෂණ රංගනය (කේවල)

(i) නිර්දේශිත නාට්‍ය පෙළෙහි තමන් තෝරා ගත් චරිතයක සංවාද කොටසක් ඉදිරිපත් කිරීම
(විනාඩි 02යි) (ලකුණු 10)

(ii) ගුරුවරයා විසින් තෝරා දෙන සංවාද කොටසක් ඉදිරිපත් කිරීම
(විනාඩි 02යි) (ලකුණු 10)

නිර්ණායක
1. කටහඬ හඬ ප්‍රක්ෂේපනය හා උච්චාරණය
2. චරිතයට හා අවස්ථාවට අනුකූලවීම
3. භාවාත්මක නිරූපණය
4. ශාරීරික ප්‍රකාශනය

(02) ක්ෂණික නිරූපණ (කේවල)

දෙන ලද චරිතයක සිද්ධියක් / අවස්ථාවක් නාට්‍යානුසාරීව ගොඩ නගමින් එසැනින් නිරූපණය කර පෙන්වීම (විනාඩි 03යි) (ලකුණු 10)

නිර්ණායක
1. නාට්‍යෝචිත අවස්ථාවක් ගොඩනැගීම
2. කටහඬ, උච්චාරණය චරිතයට, අවස්ථාවට උචිත වීම
3. යෝග්‍ය භාවමය ප්‍රකාශනය
4. ශාරීරික ප්‍රකාශනය හා අවකාශ භාවිතය

(03) නාට්‍ය ගීතය (කේවල)

ශිෂ්‍යයා කැමති ඕනෑම නාට්‍ය ගීතයක් ගයමින් හා රඟමින් ඉදිරිපත් කිරීම
(විනාඩි 03යි) (ලකුණු 10)

නිර්ණායක
1. නිවැරදි තනුව හා තාලය
2. නිවැරදි පදමාලාව හා මතකය
3. මනෝභාවික ප්‍රකාශනය
4. ශාරීරික ප්‍රකාශනය

(04) කථා පුවතක් නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කිරීම කේවල (කේවල)
(විනාඩි 05යි) (ලකුණු 10)

නිර්ණායක
1. කථාන්දර තෝරාගැනීම හා ඒ පිළිබඳ අවබෝධය
2. කටහඬ, හඬ ප්‍රක්ෂේපණය හා උච්චාරණය
3. චරිතයට හා අවස්ථාවට උචිත භාවමය නිරූපණය
4. ශාරීරික ප්‍රකාශනය, රංග උපක්‍රම හා අවකාශ භාවිතය

| | |
|---|---|
| ලිඛිත පරීක්ෂණය සඳහා | ලකුණු 50 |
| ප්‍රායෝගික පරීක්ෂණය සඳහා | ලකුණු 50 |
| මුළු ලකුණු | 100 |